## තුරුසවිය අරමුදල 2012
---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

**මෙම වාර්තාවේ** 1.2 **ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින්** 2012 **දෙසැම්බර්** 31 **දිනට තුරුසවිය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී** ලංකා රාජ්‍ය අංශයේ **ගිණුම්කරණ** ප්‍රමිතිවලට **අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික දීමනා ලෙස රු.**374,201 **ක් ගෙවීම් කර තිබුණද, පාරිතෝෂිත වෙන් කිරීම් ගිණුමේ රු.**312,042 **ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකශනවල පාරිතෝෂිත වියදම රු.**62,159 **ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර, එය වෙනත් දීමනා ගිණුමට එකතු කර තිබූ බැවින් එම** ගිණුමෙහි **වැඩිපුර රු.**62,159 **ක් දක්වා තිබුණි.**

(ආ) තුරුසවිය අරමුදලේ ගිණුම්කරණ සටහන්වලට අනුව වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගන්නා බව සඳහන් වුවද, වෙනත් ආදායම් තුළ අන්තර්ගත වූ සාමාජික මුදල් ආදායම රු, 216,130 ක් මුදල් පදනම මත ගිණුම්වලට ගලපා තිබුණි.

1.2..2 **ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
-----------------------------------

**තුරුසවිය සමිති වෙතින් තුරුසවිය අරමුදලට අයවිය යුතු , එකතුව රු.**1,343,702 **ක් වූ ණය මුදල් වර්ෂ** 5 **කට වැඩි කාලසීමාවක සිට අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම අයවිය යුතු ශේෂයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.** මෙම අයවිය යුතු ණය ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීමද ලබාගෙන නොතිබුණි.

1.2.3 **නීති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| **නීති, රීති, රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 1993.12.31 දිනැති අංක පීජ්ඒ/6/1/1 දරන **ජනාධිපති කාර්යාල චක්‍රලේඛය** | **අරමුදලේ සභාපති** රු.466,408 **ක වියදම් දරා ඉතාලි සංචාරයකට සහභාගි වී තිබූ අතර, සංචාරයෙන් අරමුදලට අත්වී ඇති ප්‍රයෝජන, නව අදහස් සම්බන්ධ වාර්තාවක්** 2013 ඔක්තෝබර් 14 දින වන විටත් **ඉදිරිපත් කර නොතිබුණි.** |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

**සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය භාණ්ඩාගාරයෙන් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද** රු.18,346,430 **ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු** රු.476,904 **ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද** රු.11,786,774 **ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු** රු.3,293,692 **ක** ඌනතාවයක් **වූයෙන් පසුගිය වර්ෂය හා සැසදීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ** රු.3,770,596 **ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.**

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 **වර්ෂය සඳහා** රු.18,638,936 **ක් වූ අරමුදලේ සමස්ථ වියදමෙන් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණේ** රු.8,083,739 **ක්** හෙවත් සියයට 43 ක් පමණි.

(ආ) 2012 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත රු.24,992,100 **ක් වූ වියදම මූල්‍යනය කිරීම සඳහා අරමුදල විසින්** රු.1,013,000 **ක ස්වකීය ආදායමක්** රැස්කිරීමට බලාපොරොත්තු **වුවද, සමාලෝචිත වර්ෂය තුළදී** රැස්කර **තිබුණේ ඉන්** රු.764,930 **ක් හෙවත්** සියයට 76 **ක ආදායමක් පමණි.**

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්යසාධනය**

------------------

**2000 අංක 23 දරන තුරුසවිය පනත ප්‍රකාර තුරුසවිය අරමුදල පිහිටුවීමේ** පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට තුරුසවිය සමිති 671 ක් ලියාපදිංචි කර තිබුණි. සමිති රසක් අක්‍රිය තත්ත්වයේ පවතින බවත්, සමිති මඟින් සාමාජිකයින්ට ඉටු කෙරෙන කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳව නිසි අවබෝධයක් ඔවුන් අතර නොමැති සමිති පවා තිබූ බවත්, නිරීක්ෂණය විය. වර්ෂය තුළදී අළුතින් ලියාපදිංචි කර තිබුණේ සමිති 04 ක් පමණි.

(ආ) සමිති විසින් ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, ලියාපදිංචි කරන ලද සමිති 671 න් සමිති 600 ක් 2012 වසර සඳහා අර්ධ වාර්ෂික වාර්තා හෝ එවා නොතිබුණි.

(ඇ) රබර් වතු හිමියන්ගේ නිෂ්පාදන තත්ත්වය දිරිගැන්වීම සඳහා රබර් රෝල් ජෝඩු, සමූහ සැකසුම් මධ්‍යස්ථාන ලබාදුන්නද ඒවා උපයෝජනය කිරීම පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුකර තිබූ බවට වාර්තා නොවුණි.

(ඈ) සමිති පිහිටුවීම හා ශක්තිමත් කිරීම සඳහා රු.462,527 ක වියදමක් දරා තිබූ නමුත් වියදම් දැරීමෙන් අනතුරුව පසු විපරම් කිරීමක් සිදුකර තිබූ බව හෙළිදරව් නොවුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ඇනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 25 ක් සැලැසුම් කර තිබුණද, රු.635,058 ක් වැය කර ඉන් 18 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) 2012 වර්ෂයේ දිවිනැගුම වැඩසටහන යටතේ සමූහ සැකසුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රු.මිලියන 9 ක් සමිති 4 කට ලබාදීමට තෝරාටගන තිබුණත්, දෙන ලද කාලසීමාව තුළ අදාළ කාර්යයන් නිමකර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

**තුරුසවිය අරමුදල මගින් සාමාජකයින්ගෙන් අයකර ගනු ලබන සාමාජක මුදල් සම්බන්ධයෙන් පහත** සඳහන් **නිරීක්ෂණයන්** කරනු ලැබේ.

(අ) එක් එක් සමිතිවලින් **ලැබියයුතු සාමාජක අරමුදල් සහ වර්ෂය තුළ මුදලින් ලැබීම්** විධිමත් පරිදි වාර්තාගත කර නොතිබුණි.

(ආ) සාමාජික මුදලින් තුරුසවිය අරමුදලට බැර කරනු ලබන සියයට 50 ක මුදල සඳහා විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(ඇ) එකතු කරගනු ලබන සාමාජික මුදලින් සාමාජකයින්ට ප්‍රතිලාභ සැලසිය හැකි විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා නොතිබීම හේතුවෙන් තුරුසවිය අරමුදල ගන්නා ලද තීරණ බොහොමයක් තුරුසවිය සමිති මගින් ක්‍රියාත්මක නොකරන බව නිරීක්ෂණය විය.

(ඈ) සාමාජික මුදල් ගෙවීමේදී සමිති සාමාජිකයින්ට සමිතිය විසින් ලදුපත් නිකුත් කිරීමේදී ඒවා පසුව වෙනස් කිරීම්, ලදුපත් අනු අංක පිළිවෙලින් නිකුත් නොකිරීම්, විවිධ අංක වල ලදුපත් නිකුත් කිරීම්, සමිතියෙන් හා ප්‍රධාන කාර්යාලයෙන් එක් සාමාජික මුදල් ලැබීමක් සඳහා ලදුපත් 2 ක් නිකුත් කිරීම.

(ඉ) ඉදිරි වැඩසටහන්, අනුමත වැඩසටහන් හා කළ වැඩසටහන්වල නොගැලපීම් තිබුණු අතර, සංශෝධනයන් නැවත අනුමත කර නොතිබුණි. අධීක්ෂණය නොවූ හා අනුමත නොවූ කළ වැඩසටහන් සඳහා ගමන් වියදම් අනුමත කර තිබුණි.

3.3 අරමුදල් උපයෝජනය

------------------------

සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වෙනුවෙන් රජය විසින් රු. 10,292,000 ක් අරමුදල වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රදාන ලබා ගැනීමේදී අරමුදල විසින් 2012 ජනවාරි 01 දිනට ආයෝජනය කර තිබුණු රු.4,151,268 ක් වූ මුදල් භාණ්ඩාගාරයට අනාවරණය කර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මෙම ආයෝජනයෙහි වටිනාකම රු. 4,564,211 ක් විය.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තුරුසවිය අරමුදල විසින් රබර් රෝල් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රබර් ගොවීන්ට සියයට 50 ක සහනාධාරයක් ලබාදෙන බැවින් රබර් රෝල් මැෂිමෙහි ගුණත්වය හා අඩු මිල සළකා බැලිය යුතු වුවත් එලෙස සිදු නොකර රු.173,280 ක අනාර්ථික වියදමක් දරා තිබුණි.

(ආ) රබර් පර්යේෂණ ආයතනය විසින් අනුමත ගුණාත්මකභාවය නොමැතිවීම හේතුවෙන් 2008 වසරේ මිලදී ගෙන තිබූ කිරිපිහි 743 න් කිරිපිහි 575 ක් 2011 දෙසැම්බර් 31 වන විටත් ගබඩාවේ පැවති අතර ඒවා මලකඩකා තිබුණි. 2012 වර්ෂයේදී ඒවා සාමාජකයන්ට නොමිලයේ ලබාදී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

**සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන්** 11 **ක් සම්බන්ධයෙන්** සියයට 5 **සිට** සියයට 664 **දක්වා අයවැයගත වියදම ඉක්මවා වියදම්** කර තිබුණු බැවින් **අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.**

5. **පද්ධති හා පාලන**

--------------------

**විගණනයේදී නිරීක්ෂණය** වූ පද්ධති හා පාලන **අඩුපාඩු පිළිබඳව වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇත. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.**

(අ) **අයවැය පාලනය**

(ආ) **තොග පාලනය**

(ඇ) ගෙවීම් ක්‍රියාවලිය

(ඈ) **තුරුසවිය සමිති විධිමත්ව ලියාපදිංචි කිරීම**

(ඉ) **කාර්ය සාධන ක්‍රියාවලිය**

(ඊ) ආදායම් හඳුනාගැනීම